ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 9th March 2021.

පැමිණිලි පාර්ශවය : ඒ.එම්. බණ්ඩම්මා මිය,
පී.එම්.සුජාතා මාලනී බාරේ,
තිස්සවැව පාර, උඩගම,
මහව.

වගඋත්තර පාර්ශවය : 01. නැගෙනහිර දිස්ත්‍රික් ඉංජිනේරු,
දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලය,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
ත්‍රිකුණාමලය.

02. දුම්රිය සාමාන්‍යාධිකාරී (පාලන),
දුම්රිය මූලස්ථානය,
මරදාන, කොළඹ 10.

03. අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත, කොළඹ 10.

පැමිණිලි අංකය : ***HRC/AP/446/2017(W)***

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තම ස්වාමි පුරුෂයා වන රණසිංහ හෙට්ටිආරච්චිලාගේ අමරසිරි රණසිංහ යන අය 1977 වර්ෂයේ අගභාගයේ දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවා අංක 7574 යටතේ කම්කරුවෙකු ලෙස



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

සේවයට බැඳී එහි සේවය කළ බවත්, අනතුරුව ඔහුගේ සේවය නතර කරන ලද බවත්, 1993.06.06 දින ළිඳකට ඇදවැටී ඔහු මිය ගිය බවත්, පසුව වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වී සිටි බැවින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපට හිමිකම් ඉල්ලා 2017.08.05 වන දින නැගෙනහිර දුම්රිය දිස්ත්‍රික් ඉංජිනේරු වෙත අභියාචනයක් භාරදුන් නමුත්, ඒ සම්බන්ධයෙන් පිළිතුරක් නොලද බවත්ය. එබැවින් තමන් වෙත වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසාදෙන ලෙසට මෙම පැමිණිල්ල ඉදිරිපත් කරමින් කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.

වගඋත්තරකාර පාර්ශවීය කරුණු දැක්වීම :-

01. නැගෙනහිර දිස්ත්‍රික් ඉංජිනේරු

දිස්ත්‍රික් ඉංජිනේරු (නැ/දි) වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරමින් පරිපාලන නිලධාරී (නැ/දි) විසින් දුම්රිය සාමාන්‍යාධිකාරී, කොළඹ වෙත රණසිංහ මහතාගේ ලිපිගොනුව යොමුකළ බව 2017.10.20 දින කොමිෂන් සභාවට පිටපත් සහිතව දන්වා ඇත.

02. දුම්රිය සාමාන්‍යාධිකාරී

වගඋත්තරකාර අධ්‍යක්ෂ (පරිපාලන), ශ්‍රී ලංකා දුම්රිය සේවය, විසින් දන්වා ඇත්තේ, සේවා අංක 11570 දරණ ආර්.එච්.ඒ.අමරසිරි රණසිංහ මහතා 1978.03.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි එක් අවුරුදු ප්‍රවාසන කාලයකට යටත්ව *III* පන්තියේ තහඩු තබන්නා තනතුර සඳහා පත්වීමක් ලැබ දිස්ත්‍රික් ඉංජිනේරු (උතුර) යටතේ, මාන්කුලම මාර්ග අංශයට අනුයුක්තව සේවය කර ඇති බවත්, ප්‍රවාසන කාලය අවසානයේ 1978.03.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි 1982.09.15 දින පත්වීම් ස්ථිර කර ඇති බවත්, 1978.08.04 දින සිට සේවයට වාර්තා නොකිරීම මත දිස්ත්‍රික් ඉංජිනේරු (නැ/දි)ගේ අංක කැ.83/11570/67 හා 1987.08.18 දිනැති ලිපියෙන් ධූරය හැරයාමේ නිවේදනය නිකුත් කර ඇති බවත්ය. මෙම කාලය අතරතුර රණසිංහ මහතා රජයේ හා ආයුර්වේද වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම මත මාර්ග ෆෝමන්ගේ (මොරගොල්ලාගම) අංක 11570/87 හා 1987.08.27 දිනැති ලිපියෙන් සේවයට වාර්තා කිරීමට ඉඩදී දිස්ත්‍රික් ඉංජිනේරු(නැ/දි) ගේ අංක කැ.83/11570/67 හා 1987.08.31 දිනැති ලිපියෙන් 1987.08.18 දිනැති සේවය හැරයාමේ නියෝගය අවලංගු කර ඇති බවත් දක්වා ඇත.

නැවතත් රණසිංහ මහතා 1988.08.29 දින සිට නොදන්වා සේවයට නොපැමිණීම මත දිස්ත්‍රික් ඉංජිනේරු(නැ/දි) ගේ අංක කැ.83/11570/67 හා 1988.09.15 දිනැති ලිපියෙන් 1988.08.29 දින සිට ධූරය හැරයාමේ නිවේදනය නිකුත් කර ඇති අතර ඒ අනුව නැවත සේවය ඉල්ලමින් අයදුම්පතක් හෝ ඉදිරිපත් කර නොමැති බවත් දක්වා ඇත.

රණසිංහ මහතාගේ පත්වීම එනම් 1978.03.15 දින සිට 1988.03.15 දින දක්වා වසර 10ක සේවා කාලයක් පවතින නමුත් විශ්‍රාම වැටුප් තත්වයට පත්කර නොමැති බවත්, එබැවින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ දායකත්වය හිමිවී නොමැති බවත්, පෞද්ගලික ලිපිගොනුව අනුව රණසිංහ මහතා විවාහකයෙකු බවට කිසිදු ලේඛනයක් තිබී නොමැති බවත්, 2017.08.05 දිනැතිව මෙම රණසිංහ මහතාගේ නීත්‍යානුකූල භාර්යාව බව සඳහන් කරමින් විවාහ සහතිකය, රණසිංහ මහතාගේ මරණ සහතිකය, බණ්ඩම්මා මහත්මියගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කරමින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ලබාදෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බවත්, ඒ අනුව රණසිංහ මහතාට හිමි විශ්‍රාම වැටුප් තත්වයට පත්කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා අදාළ අංශ වෙත යොමු කිරීමට කටයුතු කර ඇති බවත් දක්වා ඇත.

**නිරීක්ෂණ හා නිගමනය :-**

පැමිණිලිකාරිය වන කේ.ආර්.ඩී.ඩබ්ලිව්.එම්.බණ්ඩම්මා යන අය විසින් ඇයගේ ස්වාමි පුරුෂයා වන ආර්.එච්.ඒ.අමරසිරි රණසිංහ මහතාගේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපේ හිමිකම ලබාදෙන ලෙස දන්වා 2017.08.05 දින නැ/දිස්ත්‍රික් ඉංජිනේරු, ශ්‍රී ලංකා දුම්රිය සේවය, ත්‍රිකුණාමලය වෙත ලිපි යොමුකර ඇත.

ආර්.එච්.ඒ.රණසිංහ මහතා සේවා අංක 11570 යටතේ *1978.03.15 වන දින සිට III* පන්තියේ තහඩු තබන්නා තනතුර සඳහා පත්වීමක් ලබාගෙන දිස්ත්‍රික් ඉංජිනේරු (උතුර) යටතේ මාන්කුලම මාර්ග අංශයට අනුයුක්තව සේවය කර ඇත.

*1987.08.04 දින සිට සේවයට වාර්තා නොකිරීම මත* දිස්ත්‍රික් ඉංජිනේරු (නැ/දි)ගේ අංක කැ.83/11570/67 හා *1987.08.18* දිනැති ලිපියෙන් ධූරය හැරයාමේ නිවේදනය නිකුත් කිරීමෙන් අනතුරුව රණසිංහ මහතා විසින් රජයේ හා ආයුර්වේද වෛද්‍ය සහතික ඉදිරිපත් කරමින් සේවයට වාර්තා කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. ඒ අනුව නැවත *1987.08.18 දිනැති සේවය හැරයාමේ නියෝගය අවලංගු කර සේවයට වාර්තා කිරීමට අවසර ලබාදී ඇත.*

නැවතත් රණසිංහ මහතා 1988.08.29 දින සිට නොදන්වා සේවයට පැමිණ නොමැති අතර, දිස්ත්‍රික් ඉංජිනේරු (නැ/දි)ගේ අංක කැ.83/11570/67 හා 1988.09.15 දිනැති ලිපියෙන් 1988.08.29 දින සිට ධූරය හැරයාමේ නිවේදනය නිකුත්කර ඇති අතර, නැවත සේවය ඉල්ලා අයදුම්පතක් හෝ ඉදිරිපත් කර නොමැත.

ඒ අනුව 1978.03.15 දින සිට 1988.09.15 දින දක්වා වසර 10ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත. නමුත් විශ්‍රාම වැටුප් හිමි තත්වයට පත් කිරීමට කටයුතු කර නොමැති බැවින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ දායකත්වය ද හිමි වී නොමැති බව නිරීක්ෂණය වේ.

කෙසේ වෙතත් පැමිණිලිකාරියගේ ස්වාමියා අමරසිරි රණසිංහ යන අයගේ වසර 10ක සේවා කාලය සලකා බලා ඔහුට විශ්‍රාම වැටුප් හිමි තත්වයට පත්කිරීමට අවශ්‍ය පියවර ගෙන ඒ බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇති බවද නිරීක්ෂණය වේ. ඒ අනුව පැමිණිලිකාරියට අනත්දරු වැටුප ලබාදීමේ බාධාවක් නොමැති බව පෙනීයයි.

මෙකී කරුණු සම්පූර්ණ කිරීමෙන් පසු මේ සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක විවැ/ප්‍රති04/දෙ-2/06/438 හා 2018.09.28 දිනැති ලිපියෙන් දන්වා ඇත්තේ, රණසිංහ මහතාට වැන්දඹු අනත්දරු අරමුදලේ හිමිකම ලබාදී තිබේනම් පමණක් ජාතික හැඳුනුම්පත් අංකය පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් තහවුරු කර වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංකයක් ලබා ගැනීමට කටයුතු කරන ලෙසය.

අමරසිරි රණසිංහ මහතා හැඳුනුම්පතක් ලබාගෙන තිබේද යන්න පිළිබඳව පරීක්ෂාවන් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙතින් තොරතුරු ලබා ගැනීමට කටයුතු කර ඇති අතර, ඒ අනුව ආර්.එච්.ඒ.අමරසිරි රණසිංහ මහතා නමට 1943.05.24 ලෙස සඳහන් උපන් දිනයට අදාළව හැඳුනුම්පතක් නිකුත් වූ බවට දෙපාර්තමේන්තු වාර්තා නොමැති බව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් විසින් අංක *DRP/OP/CCU/2/1/17/1681/2018* හා 2018.12.31 දිනැති ලිපියෙන් දන්වා ඇත.

මේ පිළිබඳව කරුණු දන්වා දිස්ත්‍රික් ඉංජිනේරු(නැගෙනහිර) විසින් අංක කැ.83/විවිධ හා 2019.01.24 දිනැතිව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙතින් උපදෙස් ඉල්ලා ඇති අතර, එයට පිළිතුරු වශයෙන් විශ්‍රාම වැටුප් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක විවැ/ප්‍රති04/දෙ-2/06/438 හා 2019.02.25 දිනැති ලිපියෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ තොරතුරු යාවත්කාලීන කිරීම සහ විශ්‍රාම ගෙවීම් කටයුතු තහවුරු කිරීමේදී පාදක වන්නේ ජාතික හැඳුනුම්පත් අංකය මත වන බවත්, ඉන් පරිබාහිර ක්‍රමවේදයක් නොමැති බවත්, ජාතික හැඳුනුම්පතේ තොරතුරු සනාථ කර ගැනීම මත පමණක් පදනම්ව මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කළයුතු බවත් දන්වා ඇත.

වගඋත්තරකරුවන් හට පැමිණිලිකාරිය වෙත වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ලබාදීමේදී මූලික ගැටළුව වී ඇත්තේ, පැමිණිලිකාරියගේ ස්වාමියා වන රණසිංහ මහතාගේ ජාතික හැඳුනුම්පත නොමැති වීමයි. වර්තමානයේදී විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු කිරීමේදී පාදක වන්නේ විශ්‍රාමිකයන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය අදාළ කරගෙන බවත්, ඉන් පරිබාහිර ක්‍රමවේදයක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත

නොමැති බවත්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දන්වා ඇත. දෙපාර්තමේන්තුව මෙම ක්‍රමවේදය අනුගමනය කරමින් සිටිනුයේ, එම දෙපාර්තමේන්තුවේ පරිපාලනමය පහසුව හෝ අවශ්‍යතාවය සඳහා බව පෙනීයන අතර, දෙපාර්තමේන්තුවේ පරිපාලනමය කටයුතු පහසුකර ගැනීම සඳහා යොදා ගන්නා ක්‍රමවේදයක් පදනම්ව වැන්දඹු විශ්‍රාම වැටුප අහිමි කළ නොහැකි වන අතර, මෙම පරිපාලන ක්‍රමය යොදාගත යුතු බවට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාම වැටුප් චක්‍රලේඛනයක් මෙතෙක් නිකුත් කර නොමැති බවද නිරීක්ෂණය වේ.

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් 2015.09.27 දින නිකුත් කර ඇති අංක 06/2015(1) දරණ චක්‍රලේඛනය අනුව විශ්‍රාම වැටුප් හිමිකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන ප්‍රධාන ලේඛන වන්නේ විශ්‍රාමිකයාගේ විවාහ සහතිකය හා මරණ සහතිකය වේ. වෙනත් ප්‍රධාන ලේඛන ඇතුළත් වන අතර, මෙම ලේඛන අතර මියගිය විශ්‍රාමිකයාගේ ජාතික හැඳුනුම්පතේ අංකය පිළිබඳව කරුණු දක්වා නොමැත. මෙකී චක්‍රලේඛනයේ සඳහන් කරුණු සලකා බැලීමේදී වැන්දඹු විශ්‍රාම වැටුප් හිමිකම් ලබා ගැනීම සඳහා මියගිය විශ්‍රාමිකයාගේ ජාතික හැඳුනුම්පතේ අංකය අත්‍යාවශ්‍ය කාරණයක් නොවන බව නිරීක්ෂණය වේ.

එමෙන්ම අංක 01/2015 (සංශෝධන 11) දරණ හා 2018.06.26 දිනැති විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛනය මඟින් වැන්දඹු/වැන්දඹු අනත්දරු මුදල් ආපසු ගෙවීමේදී මාර්ගගතව අයදුම්පත් යොමු කිරීම සම්බන්ධයෙන් චක්‍රලේඛනයක් නිකුත් කර ඇති අතර, එම චක්‍රලේඛනයේ 07 මඟින් 2016.10.10 දිනෙන් පසුව විශ්‍රාම ගිය විශ්‍රාමිකයින් සඳහා අනිවාර්යයෙන්ම මෙම මාර්ගගත ක්‍රමය අදාළ කරගත යුතු බව දන්වා ඇත.

එමෙන්ම මෙම චක්‍රලේඛනයේ රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලබන නිලධාරීන්/නිලධාරිනියකට සේවා අවසාන ප්‍රතිලාභ කඩිනමින් හිමි ගැන්වීම සඳහා මෙම මාර්ගගත ක්‍රමය යොදා ගන්නා බවද මෙම චක්‍රලේඛනයේ අර්ථ දක්වා ඇති බවද නිරීක්ෂණය වේ.

ඉහත සඳහන් චක්‍රලේඛනයන් මඟින් හෝ වෙනත් චක්‍රලේඛනයක් මඟින් වැන්දඹු විශ්‍රාම වැටුප ලබා ගැනීමේදී මියගිය විශ්‍රාමිකයාගේ ජාතික හැඳුනුම්පත් අංකය නොමැතිවීමෙන් විශ්‍රාම වැන්දඹු වැටුප් අහිමිවන බව දන්වා නොමැති හෙයින්ද, අදාළ චක්‍රලේඛනයේ සඳහන් මාර්ගගත ක්‍රමය 2016 වසරෙන් පසු විශ්‍රාම ගිය අය සඳහා අදාළ කර ගැනීමට එහි ප්‍රතිපාදන සලසා තිබීමද, මෙම විශ්‍රාමිකයා 2016ට පෙර විශ්‍රාම ගෙන තිබීමද යන කරුණු සලකා බැලීමේදී පැමිණිලිකාරියට වැන්දඹු විශ්‍රාම වැටුප නොලැබීමෙන් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් මූලික අයිතිවාසිකම පැමිණිලිකාරිය සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව පැමිණිලිකාරියට හිමි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ලබා දීමට වගඋත්තර පාර්ශවය විසින් කටයුතු කළ යුතුය.

2021. 04. 21 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

21/3/23

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/